One Laptop Per Child = OLPC

"සෑම දරුවෙකුට ම ලැප්ටොප් පරිගණකයක්"

# මූලික සංකල්ප

cc BY

රෂාන් අනුෂ්ක {rashan.uoc@gmail.com}

# OLPC යනු කුමක්ද?

- OLPC යනු One Laptop Per Child හෙවත් සෑම දරුවෙකුට ම ලැප්ටොප් පරිගණකයක් යන්නයි.
- ඇමෙරිකානු ජාතික මහාචාර්ය නිකොලස් නිග්‍රොපොන්ටේගේ මූලිකත්වයෙන් ඇරඹි ව්‍යාපෘතියකි.
- මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ, ලොව දිළිඳුතම දරුවන්ට නව අධ්‍යපනික අවස්ථා ඇති කරලීමයි. ඒ සඳහා සෑම දරුවෙකුට ම සාමූහිකව, විනෝදකාමීව හා ස්වෝත්සාහයෙන් ඉගනීමට අනුබල දෙන මෘදුකාංගවලින් සපිරි අඩු වියදම්, කල් පවතින හා අවම බලශක්තියකින් ක්‍රියාකරන ලැප්ටොප් පරිගණකයක් ලබා දේ.

රෂාන් අනුෂ්ක {rashan.uoc@gmail.com}

# ඇයි?

- ඇතැම් විට ආහාර, ජලය, නිවාස හෝ විදුලි බලය පවා නොමැති ළමයෙකුට ලැප්ටොප් පරිගණකයක් ලබා දෙන්නේ ඇයි?
- මෙය ලැප්ටොප් පරිගණක ව්‍යාපෘතියක් නොව අධ්‍යාපනික ව්‍යාපෘතියකි.
- ඇතැම් විට ආහාර, ජලය, නිවාස හෝ විදුලි බලය පවා නොමැති ළමයෙකුට අධ්‍යාපනය ලබා දෙන්නේ ඇයි?
- මේ සියලු ගැටළු සඳහා විසඳුම්වල මූලික සංරචකයක් වන්නේ පිරිපුන් අධ්‍යාපනයයි.

CC BY

# OLPC මූලික සංකල්ප

- අයිතිය ළමයාට ම (Child Ownership)
- අඩු වයස් සීමා (Low Ages)
- සන්තෘප්තභාවය (Saturation)
- සම්බන්ධතාව (Connection)
- නිදහස් හා විවෘත මූලාශ්‍ර (Free and Open Source)

CC BY

# OLPC මූලික සංකල්ප – අයිතිය ළමයාට ම

- OLPC මඟින් නිර්මාණය කරන ලද මෙම XO නම් අතිවිශේෂ උපකරණය ප්‍රාථමික වයස් සීමාවේ ළමයින් සඳහා ම නිපදවන ලද්දකි.
- එහි අයිතිය එක් එක් ළමයාගේ මූලික අයිතිවාසිකමකි.
- තමන්ගේ පරිගණකය ආරක්ෂා කර ගැනීම, හොඳින් සැලකීම හා එය බෙදාහදා ගැනීම ආදී වගකීම් ළමයාට ම පැවරේ.
- පාසල් වේලාවට අමතරව තම නිවෙසේදී පවා එය භාවිත කිරීමට ඉඩ ලබාදීම මඟින් එය අත්හදා බැලීමට වැඩි කාලයක් ළමයාට (හා පවුලේ අනෙකුත් සාමාජිකයින්ට) ලැබේ.

"මම මගේ *XO*ව පාවහන් යුගලක් මෙන් පළඳිමි"

CC BY

# OLPC මූලික සංකල්ප – අඩු වයස් සීමා

- ප්‍රාථමික පාසල් කාලය ආවරණය වන සේ වයස අවු. 6 – 12 ළමයින් සඳහා සැලසුම් කර ඇත
  - මෙම වයස් සීමාවලින් පරිබාහිරව වුව ද භාවිතය වරදක් නොවේ
- මෙය භාවිත කිරීම සඳහා ළමයින්ට කියවීමට හෝ ලිවීමට හැකියාවක් තිබීම අත්‍යවශ්‍ය නොවන අතර මෙය භාවිතයෙන් එම හැකියා වර්ධනය වනු ඇත.
- සෑම වසරක ම නව ළමයින් කණ්ඩායමක් මෙම වැඩසටහන වෙත අලුතින් එක් වන අතර වැඩසටහනේ ප්‍රගතිය මැනිය යුත්තේ එක් එක් ළමයා විසින් පවත්වාගෙන යනු ලබන ක්‍රියාකාරකම් සටහන් (Journal)  හා එමඟින් දිස්වෙන ඉගෙනුම් පථ (Learning paths) ඇසුරෙනි.

"මට දුර ගමනක් යෑම සඳහා හොඳ *XO* පාවහන් යුගලක් ඇත"

cc BY

රෂාන් අනුෂ්ක {rashan.uoc@gmail.com}

# OLPC මූලික සංකල්ප – සන්තෘප්තභාවය

- තම හැකියාව පරිදි තෝරාගන්නා ලද කණ්ඩායමක (සම්පූර්ණ රටක්, පළාතක්, නගරයක් හෝ ගමක්) <u>සියලු ම</u> ළමයින් සඳහා පරිගණක ලබා දීම.
  - එකවර විශාල පරිගණක සංඛ්‍යාවක් අවශ්‍යවීම
  - කිසිදු ළමයෙකු මඟ නොහැරීම
- මුළු සමාජයම මෙම වැඩසටහන සමඟ බද්ධ වීම
- ළමයින්ට මුළු සමාජයේම සහය ලැබීම
- මෙම පරිගණක තුළ සහජයෙන් පවතින සම්බන්ධිත ලක්ෂණය නිසා මුළු සමාජයට ම එක් ව නැඟී සිටීමට හැකියාව ලැබීම
- කිසිදු බෙදීමක් නොමැති බැවින් ශක්තිමත් සමාජයක් ගොඩනැඟීම

"පිරිපුන් අධ්‍යාපනය ප්‍රතිශක්තිකරණ වැඩසටහනක් මෙනි. එය සැම කෙනෙකු වෙතම ලැබෙන අතර ඔවුන් නූගත්කමින් හා අසහනයෙන් මුදා ගනී"

CC BY

රෂාන් අනුෂ්ක {rashan.uoc@gmail.com}

# OLPC මූලික සංකල්ප – සම්බන්ධතාව

- XO පරිගණකය නිර්මාණය කර ඇත්තේ ලොව වඩාත් සිත් ඇදගන්නා සුලු රැහැන් රහිත ජාලකරණ තාක්ෂණයක් භාවිත කරමිනි
  - පරිගණකය නිවා දමා ඇති විටත් එය අන් පරිගණක සමහ සම්බන්ධව පවතී!
  - එක් පරිගණකයක් අන්තර්ජාලයට සම්බන්ධ වූ විට ඒ හරහා අන් සියලු ම පරිගණකවලට අන්තර්ජාලයට සම්බන්ධ විය හැකි ය.
  - අසල්වැසි ළමයින්ට පරිගණක හරහා නිරතුරුව ම තොරතුරු බෙදා හදා ගැනීම, කථා බහ කිරීම (රූප, ශබ්ද හා පෙළ යන තෙවර්ගයෙන් ම), එක් ව සංගීත නිර්මාණකරණයේ යෙදීම, ඉ-පොත් කියවීම, සාමූහික පරිගණක ක්‍රීඩා ආදිය සිදු කිරීමේ හැකියාව ඇත.
- එහි ඇති සුවිශේෂී බැටරිය විවිධ මාර්ග භාවිතයෙන් ආරෝපණය කළ හැකි අතර (සූර්ය බලය) සාපේක්ෂව වැඩි කාලයක් පරිගණකයට බලය සපයයි.
- පන්ති කාමරය තුළ මෙන් ම දැඩි හිරු එළිය මධ්‍යයේ වුව ද පැහැදිලිව පෙනෙන පරිදි පරිගණක තිරය නිර්මාණය කර ඇත.
- සාමාන්‍ය සීමාවලින් ඔබ්බට පාසල පුළුල් කරයි.

“අපි එක්ව කථා කරන කල්හි අපි එක්ව වාසය ද කරමු”

CC BY
රෂාන් අනුෂ්ක {rashan.uoc@gmail.com}

# OLPC මූලික සංකල්ප – නිදහස් හා විවෘත මූලාග්‍ර

- XO පරිගණකයක් සතු ළමයා හුදු පවතින දැනුම පමණක් ලබා ගන්නා අක්‍රීය අයෙකු නොව තම අවට පරිසරය සමඟ සක්‍රීයව ගැටෙමින් නව දැනුම නිපදවන්නෙක් බැවින්, මීට අදාළ මෘදුකාංග, අන්තර්ගත, සම්පත් හා මෙවලම් සතුව මෙම නව අදහස් සමඟ වර්ධනය වීමේ හැකියාව තිබිය යුතු ය.
- මේවා විවිධ රටවල විවිධ ජන කොටස් මඟින් ප්‍රයෝජනයට ගන්නා බැවින් කිසිදු බාහිර බලපෑමකින් තොරව තම අවශ්‍යතා පරිදි දේශීයකරණය කිරීමට, වෙනස් කිරීමට හා තම අභිමතය පරිදි තෝරාගැනීමට සියලු දෙනාට නිදහස තිබිය යුතු ය.
- සෑම දරුවෙකු ම පවතින දැනුම වර්ධනයට දායක වන බැවින් ඒ සඳහා ඔවුන්ට සුදුසු නිදහස් හා විවෘත වටපිටාවක් තිබිය යුතු ය.

“මට නිදහස් හා විවෘත වටපිටාවක් සකසා දෙන්න, මම සතුටින් ඉගෙන ගනිමින් අන් අයට ද උගන්වන්නෙමි”

CC BY

රෂාන් අනුෂ්ක {rashan.uoc@gmail.com}